# 2024-උසස් පෙළ විශිෂ්ටයෝ:

## ජෛව පද්ධති තාක්ෂණවේදයෙන් ඉදිරියට යනවා



### ජෛව පද්ධති තාක්ෂණවේදයෙන් දිවයිනේ ප්‍රථමයා සඳලංකා මධ්‍ය විද්‍යාලයේ **නෙත්මි නවෝද්‍යා**

**පන්නල සමූහ - එච්.ඩී.හේවගේ**



මව පියා සහ සොහොයුරා සමඟ නෙත්මි

උත්සාහය සහ කැපවීම තිබේනම් කරන්න බැරි දෙයක් නැතැයි මෙවර අපොස උසස් පෙළ විභාගයේ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාවෙන් දිවයිනේ ප්‍රථම ස්ථානය ලබා ගත් ගිරිඋල්ල, සඳලංකා මධ්‍ය විද්‍යාලයේ නෙත්මි නවෝද්‍යා මාරසිංහ සිසුවිය පැවසුවාය.

ඇය අපොස සාමාන්‍ය පෙළ විභාගයෙන් ඒ සාමාර්ථ 09 ක් ලබා විශිෂ්ට ලෙස සමත් වී පන්නල ජාතික පාසලේ සිට ජෛව පද්ධති තාක්ෂණවේදය හැදෑරීමට සඳලංකා මධ්‍ය විද්‍යාලයට ඇතුළත් වී ඇත.

පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගලයාය ප්‍රදේශයේ පදිංචි සරත් මාරසිංහ හා හෙන්ඩියගල රතනජෝති මහා විද්‍යාලයේ ආචාරිනී පී. ශ්‍යාමා මල්කාන්ති මහත්මියගේ එකම දියණිය වන නෙත්මිට පන්නල ජාතික පාසලේ 10 වැනි වසරේ අධ්‍යාපනය හදාරන එක් සොහොයුරකු සිටී.

සිය ජයග්‍රහණය සම්බන්ධයෙන් ඇය වැඩිදුරටත් මෙසේ ද පැවසුවාය.

‘‘මම මූලික අධ්‍යාපනය හැදෑරුවේ පන්නල ජාතික පාසලේ. එම පාසලේ දී අධ්‍යාපන කටයුතුවල වගේම විෂය බාහිර කටයුතුවලත් නිරත වුණා. විද්‍යාලයේ නෙට්බෝල් කණ්ඩායමේ සිටියා. කථික තරගවලට සහභාගි වුණා.ඒ මොන දේ කළත් අපොස සාමාන්‍ය පෙළ විභාගයෙන් ඒ නවයක් ගත්තා. මම තාක්ෂණවේදයට හරි කැමැතියි.ඒ නිසා එම විෂය ධාරාව හදාරන්න සඳලංකා මධ්‍ය විද්‍යාලයට ඇතුළත් වුණා. මම දිනපතා පාසල් ගියා.සියලු වාර විභාගවලදී ලකුණු 80ට වැඩියෙන් ගත්තා. අද මට මේ ජයග්‍රහණය ලබා ගන්න පාසලෙන් විශාල සහයෝගයක් ලැබුණා. මගේ අම්මා, තාත්තා, මල්ලි ඇතුළු පවුලේ සියලු දෙනා වගේම මට ගුරුහරුකම් ලබා දුන් සඳලංකා මධ්‍ය විද්‍යාලයේ හිටපු විදුහල්පති අසංක චාමින්ද, වත්මන් විදුහල්පති නිශාන්ත කැලුම් කුමාර, නියෝජ්‍ය විදුහල්පතිවරුන් වන දේවිකා පතිරණ (අධ්‍යාපන පරිපාලන),නෙවිල් පද්මසිරි (පරිපාලන), අංශ ප්‍රධානී ඒ. ඒ. සඳමාලි සරණතිලකා, හිටපු සහකාර විදුහල්පතිනි එච්. පී. එස්. උෂානි ජයතිලක, සියලු විෂයන් උගන්වපු රම්ලා මල්කාන්ති වීරසිංහ, තිළිණි නිර්මිකා ගුණරත්න, ටී. තනුජා පෙරේරා යන ගුරු මෑණිවරුන් පියවරුන් වගේම පන්නල ජාතික පාසලේ එක වසරේ සිට මට ගුරුහරුකම් ලබාදුන් ගුරු මෑණිවරුන් පියවරුන් මම ආදරයෙන් සිහිපත් කරනවා. මගේ යහළු යෙහෙළියන් සියලු දෙනාත් මේ අවස්ථාවේ කෘතවේදීව සිහිපත් කරනවා.මගේ බලාපොරොත්තුව මා සමත් වුණු අංශයෙන් ඉදිරියට යන්නයි. විභාගය කිට්ටු කර පාඩම් කරන්නේ නැතිව දිනපතා ඉගෙන ගත් දේ නැවත පාඩම් කරමින් මුල සිටම විභාගයට සූදානම් වෙනවානම් අපට විභාගය ඉහළින් සමත් වෙන්න පුළුවන්. මම ඉදිරියේදී විභාගවලට මුහුණ දෙන්න ඉන්න නංගිලා මල්ලිලාට කියන්නේ උත්සාහය, කැපවීම තිබෙනවා නම් කරන්න බැරි දෙයක් නැහැ කියලයි.”

## ඉංජිනේරුවකු වී රටට සේවය කරනවා



### උසස් පෙළ ගණිත විෂය ධාරාවෙන් දිවයිනේ ප්‍රථමයා ගම්පහ බණ්ඩාරනායකයේ **ලෙසඳු රන්සර**

**ගම්පහ දිස්ත්‍රික් විශේෂ - සිසිල ගුණතිලක සහ ගම්පහ අතිරේක**



මව පියා සමඟ ලෙසඳු

උසස් පෙළ සමත්වීමට නම් පාසලේ එදිනෙදා දෙන පාඩම්, අභ්‍යාස සියල්ල කරමින් අධ්‍යයන කටයුතු උනන්දුවෙන් කරන්නැයි උසස් පෙළ ගණිත විෂය ධාරාවෙන් දිවයිනේ ප්‍රථමයා වූ ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ ලෙසඳු රන්සර සිසුවා පැවසීය.

මේ ජයග්‍රහණය ගැන ලෙසඳු රන්සර ශිෂ්‍යයා මෙසේ කීය.

‘‘මම පදිංචිවෙලා ඉන්නේ වේයන්ගොඩ-කුඹල්ඕලුවේ.1 වසර සිට 5 වසර දක්වා මූලික අධ්‍යාපනය ලැබුවේ වේයන්ගොඩ ශාන්තමරියා විද්‍යාලයෙන්. එහිදී 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 172ක් ලබා 6 වසරට ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයට ඇතුළත් වුණා. එහිදී අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයන් 09ටම A සාමාර්ථ ලබා අනතුරුව එම විද්‍යාලයේම උසස් පෙළ ගණිත අංශයෙන් අධ්‍යාපනය හැදෑරුවා.

එදිනෙදා පාසලෙන් දෙන පාඩම්, අභ්‍යාස නිතර අධ්‍යයනය කරමින් සැහැල්ලු මනසකින් කටයුතු කළා. මගේ ස්ථිර අධිෂ්ඨානයක් තිබුණා උසස් පෙළ විභාගයෙන් විශිෂ්ට ජයග්‍රහණයක් ලැබීමට. අද එය මල්ඵලගැන්විලා. තාත්තයි, අම්මයි, අයියයි අධ්‍යාපන කටයුතුවලට මාව ගොඩක් උනන්දු කළා. මගේ තාත්තා සුදත් රෝහණ කුමාරගේ. ඔහු පොලිස් දෙපාර්තමේන්තුවේ වරලත් ගණකාධිකාරිවරයෙක්.මව ගෞරි නර්මදා සේනානායක. ඇය මීරිගම රෝහලේ වෛද්‍යවරියක් ලෙස සේවය කරනවා. මට සහෝදරයන් දෙදෙනෙක් ඉන්නවා. අයියා රිවිඳු මින්සර කුමාරගේ. ඔහු මොරටුව ඉංජිනේරු පීඨයේ අධ්‍යාපනය ලබනවා. මල්ලි තෙවිඳු දම්සර කුමාරගේ. ඔහු බණ්ඩාරනායක විද්‍යාලයේ ගණිත අංශයෙන් උසස් පෙළ හදාරනවා. මගේ පන්ති භාර ගුරුතුමා වන භෞතික විද්‍යාව ඉගැන්වූ ප්‍රදීප් හපුආරච්චි සර්ටත්, රසායන විද්‍යාව ඉගැන්වූ නයෝමි මැඩම්ටත්, සංයුක්ත ගණිතය ඉගැන්වූ තුසිත සර්ටත් මට 1 වසරේ සිට උසස් පෙළ දක්වා ඉගැන්වූ සියලු සර්ලා, මැඩම්ලාටත්, මගේ තාත්තා, අම්මා සහ සහෝදරයින්ටත්, මගේ ජයග්‍රහණයට උදව් කළ සියලු දෙනාටත් ස්තූතිය පුද කරනවා. මම විනෝදාංශ ලෙස වයලීන් වාදනය කිරීම, ක්‍රිකට් ක්‍රීඩා කිරීම සහ චිත්‍රපට නැරඹීම කරනවා. මම නංගිලා මල්ලිලාගෙන් ඉල්ලා සිටින්නේ පාසලේ එදිනෙදා දෙන පාඩම්, අභ්‍යාස කර උනන්දුවෙන් වැඩ කරන්න. එවිට ඔයාලටත් මේ වගේ ජයග්‍රහණයක් ලබා ගන්න පුළුවන්. මගේ අනාගත බලාපොරොත්තුව ඉංජිනේරුවකු වී රටට හොඳ සේවයක් කිරීමයි.”

## විලාසිතා නිර්මාණවේදිනියක් වී රටට සේවය කිරීම අරමුණයි



### කලා අංශයෙන් දිවයිනේ ප්‍රථමයා ගම්පහ රත්නාවලියේ **සෙනලි චමත්කා කියයි**

**ගම්පහ දිස්ත්‍රික් විශේෂ- සිසිල ගුණතිලක සහ ගම්පහ අතිරේක**



සෙනලි මව සහ පියා සමඟ

අධ්‍යාපන කටයුතු හොඳින් නිම කර විලාසිතා නිර්මාණවේදිනියක් වී රටට සේවය කිරීම අරමුණ බව මෙවර අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් කලා අංශයෙන් දිවයිනෙන්ම ප්‍රථම ස්ථානය හිමි කර ගත් ගම්පහ රත්නාවලී බාලිකාවේ සෙනලි චමත්කා සිසුවිය පවසන්නීය.

ඇයගේ පියා වන චමින්ද සම්පත් රණසිංහ මහතා පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන අතර මව වත්සලා සඳමාලි ගෘහිණියකි. ඇය සිය ජයග්‍රහණය ගැන මෙසේ අදහස් පළ කළාය.

“මම පදිංචි වෙලා ඉන්නේ බටුවත්ත, වල්පොලයි. මම මූලික අධ්‍යාපනය ලැබුවේ බටුවත්ත ප්‍රාථමිකයෙන්. 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 164ක් ලබාගෙන ගණේමුල්ල ගලහිටියාව මධ්‍ය විද්‍යාලයට ඇතුළත් වුණා. එම පාසලේදී අ.පො.ස.(සා. පෙළ) විභාගයෙන් A සාමාර්ථ 8ක් සහ B සාමාර්ථයක් ලබා උසස් පෙළ කලා අංශයෙන් හැදෑරීමට ගම්පහ රත්නාවලී බාලිකා විද්‍යාලයට ඇතුළත් වුණා. මෙවර අ.පො.ස.(උසස් පෙළ) විභාගයෙන් කලා අංශයෙන් විෂයන් 3ටම A සාමාර්ථ ලබා දිවයිනෙන්ම ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට මට හැකියාව ලැබුණා. මේ ජයග්‍රහණය ලබා ගැනීමට මම ඉතා උනන්දුවෙන් හා කැපවීමෙන් කටයුතු කළා.

මගේ තාත්තා චමින්ද සම්පත් රණසිංහ.පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් සැරයන්වරයෙක්. අම්මා ගෘහිණියක්.මට නංගි කෙනෙකුයි මල්ලි කෙනෙකුයි ඉන්නවා. නංගි රණාලි දහම්සා. එයා බටුවත්ත ජාතික පාසලේ 10 වසරේ ඉගෙනුම ලබනවා. මල්ලි සනිරු රන්දිව්. එයත් බටුවත්ත ප්‍රාථමික විද්‍යාලයේ 2 වසරේ ඉගෙනුම ලබනවා.

මගේ අධ්‍යාපන කටයුතුවලට උදවු කළ මගේ පාසලේ විදුහල්පතිනිය වසන්තා කුමාරි මැඩම්ටත්, පන්ති භාර ගුරුතුමිය රෝසි අරුණානන්ද මැඩම්ටත්, මගේ අම්මා සහ තාත්තාටත්, අධ්‍යාපන කටයුතුවලට උදවු කළ සියලු දෙනාටත් මේ අවස්ථාවේ මගේ ස්තූතිය පුද කරනවා. මම නංගිලා මල්ලිලාට ආදරයෙන් කියන්නේ උනන්දුවෙන් කැපවීමෙන් අධ්‍යාපන කටයුතු කරන්න. එදිනෙදා පාසලේ පාඩම් වැඩ හා අභ්‍යාස නැවත නැවත කරන්න. ඉලක්කයක් ඇතිව වැඩ කර අරමුණු ඉෂ්ට කරගෙන ජීවිතය ජයගන්න කියලා. මම විනෝදාංශ වශයෙන් චිත්‍ර ඇඳීම, මැහුම් ගෙතුම් වැඩ සහ කේක් සෑදීම සිදු කරනවා. මගේ අනාගත බලාපොරොත්තුව අධ්‍යාපන කටයුතු හොඳින් කරගෙන විලාසිතා නිර්මාණවේදිනියක් වී රටට සේවයක් කිරීම යැයිද ඇය පැවසුවාය.

## වරලත් ගණකාධිකාරිවරියක් වීම මගේ හීනයක්



### වාණිජ අංශයෙන් දිවයිනේ ප්‍රථමයා කොළඹ විශාඛාවේ **අමාෂා දුලාරි**

**රන්මලී සෝමසිරි**

මෙවර උසස් පෙළ විභාගයේ වාණිජ අංශයෙන් ප්‍රථම ස්ථානය කොළඹ විශාඛා බාලිකා විද්‍යාලයේ අමාෂා දුලාරි පෙරේරා සිසුවියට හිමි වී තිබේ.

සිය ජයග්‍රහණය සම්බන්ධයෙන් ඇය මෙසේ පැවසුවාය.

මගේ මහන්සියට ප්‍රතිඵල ලැබුණු එක ගැන සතුටුයි.මුල ඉඳලම ඉලක්කයක් තියාගෙනයි අධ්‍යාපන කටයුතු කළේ.ඒ සඳහා පාසලෙන් උපරිම සහායක් හිමි වුණා.මේ වෙලාවේ පාසලේ සියලු ගුරුවරුන් මතක් කරන්න කැමතියි.පාසලේ ගුරුවරුන් ඒ අයගේ දැනුම දුන්නා. නිතරම දිරිමත් කළා. කිසිම අවස්ථාවක බිඳ වැටෙන්න දුන්නේ නැහැ.

ඒ වගේම පාසලේ පුස්තකාලයත්,පාඩම් කරන කාමරයත් සහාය වුණා.අපේ පුස්තකාලයේ පාස් පේපර්ස් සෑහෙන්න තියෙනවා.මම පහුගිය පාස් පේපර්ස් සෑහෙන්න කළා.සද්ද නැතිව පාඩම් කරන්න පුළුවන් පරිසරයක් රීඩින් රූම් එකේ තිබුණා.නිදහස් පීරියඩ්වල රීඩින් රූම් එකට ගිහින් පාඩම් කළා.මේ දේවල් මගේ ප්‍රතිඵලයට දායක වුණා.ඒ වගේම මගේ අම්මා මං වෙනුවෙන් මගේ පිටුපසින්ම හිටියා. මගේ තාත්තා අක්කාත් මේ ප්‍රතිඵලයට සහාය වුණා.

මගේ මුල් පාසල විදුර විද්‍යාලය.විදුර විද්‍යාලයෙන් මට හොඳ ෆවුන්ඩේෂන් එකක් ලැබුණා. විදුර විද්‍යාලයේ විදුහල්පති ඇතුළු ආචාර්ය මණ්ඩලයත් මේ වෙලාවේ මතක් කරනවා.

වරලත් ගණකාධිකාරිවරියක් වෙන එක මගේ හීනයක්.ඊට අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සපුරාගෙන හොඳ පුරවැසියෙන් විදියට රට වෙනුවෙන් සේවය කරන එකයි බලාපොරොත්තුව.

## කුඩා කල සිටම තිබූ වෛද්‍යවරියක් වීමේ සිහිනයට කැපවෙනවා



### ජීව විද්‍යා අංශයේ දිවයිනේ ප්‍රථමයා කුරුණෑගල මලියදේව බාලිකාවේ **සදිති නිම්හාරා**

**කුරුණෑගල අතිරේක පුෂ්පකුමාර ජයරත්න, ඉබ්බාගමුව සමූහ - කුමාරි දිසානායක සහ කුරුණෑගල විශේෂ**



කුඩා කාලයේ සිටම සිහිනය වුණේ වෛද්‍යවරියක් වීම බවත් ඒ සිහිනය ඉටු කර ගැනීමට තවදුරටත් කැප වන බවත් මෙවර උසස් පෙළ විභාගයෙන් ජීව විද්‍යා අංශයේ දිවයිනේ ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට සමත් වූ කුරුණෑගල මලියදේව බාලිකාවේ හෑගොඩආරච්චිගේ සදිති නිම්හාරා සිසුවිය කීවාය.

වයඹ පළාතට මෙන්ම මලියදේව බාලිකාවට ද ඉමහත් ගෞරවයක් ගෙන දුන් ඇය කුරුණෑගල යන්තම්පලාවේ පදිංචිකාරියකි. දියණියන් දෙදෙනකුගේ සහ පිරිමි දරුවකුගෙන් යුත් පවුලක වැඩිමහල් දරුවා වන සදිතිගේ පියා වෘත්තියෙන් විදුලි ඉංජිනේරුවරයෙකි. ඔහු ලක්ෂපාන විදුලි බලාගාරයේ සේවයේ නියුතුව සිටි කාලයේ එම ප්‍රදේශයේ පාසලකින් පහ වසරේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි සදිති, එම විභාගයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රථමයා විය. එම විභාගයෙන් සමත්ව වැඩිදුර අධ්‍යාපනයට හය වසරේ සිට මලියදේව බාලිකාවට ඇතුළත් වූ ඇය සාමාන්‍ය පෙළ විභාගයෙන් ද ඉහළින් සමත්ව උසස් පෙළ ජීව විද්‍යා අංශයෙන් අධ්‍යාපනය ලබා මේ විශිෂ්ට ජයග්‍රහණය හිමි කරගෙන තිබේ.

තම ජයග්‍රහණය ලබාගත් අයුරු ඇය මෙසේ ප්‍රකාශ කළාය.

‘‘කුඩා කාලයේ ඉඳලාම මගේ බලාපොරොත්තුව තිබුණේ වෛද්‍යවරියක් වෙන්න. පාසලේදී ලබා දුන්න වැඩ එදිනෙදාම කර අවසන් කළා. පාසලේ පැවැත්වුණු වාර විභාග සියල්ලටම මම සහභාගි වුණා. විභාගය සඳහා අවශ්‍ය සැලැස්මක් මමම හදාගත්තා. තාත්තත් ඒ සඳහා උදව් කළා. අවසන් මාස හතරේ කාලසටහනකට වැඩ කළා. ඒකෙදී අමාරු විෂයන් හඳුනාගෙන ඒ සඳහා වැඩියෙන් කාලය ගත කළා. අවුරුදු විස්සක විතර පාස් පේපර්ස් හොයාගෙන ඒවත් කළා. ඒවායින් අමාරු ගැටලු හඳුනාගෙන ආපසු ඒවත් විසඳාගෙන තමයි මම විභාගයට සූදානම් වුණේ. මේ වගේ ජයග්‍රහණයක් ලබන්න මට අම්මයි තාත්තයි තමයි ගොඩාක් උදව් කළේ. ඊට අමතරව මගේ පාසලේ විදුහල්පතිනිය අපිට ජයග්‍රහණය සඳහා විශේෂ මඟපෙන්වීමක් ලබා දුන්නා. ඒ වගේම උසස් පෙළට ඉගැන්වීම් කළ ගුරුවරුත් මට ගොඩාක් උදව් කළා. මේ හැමෝටම ගොඩාක් ස්තූතියි මේ වගේ ජයග්‍රහණයක් ලබාගැනීමට මට සහාය වීම ගැන.” සදිතිගේ සොහොයුරා මේ වනවිට සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට උසස් පෙළට සූදානම් වෙමින් සිටින අතර, සොයුරිය ද මලියදේව බාලිකාවේම ඉගෙනුම ලබයි. මව කුරුණෑගල ලක්දාස් ද මෙල් විදුහලේ ගුරුවරියක ලෙස සේවය කරන්නීය.

## අපි එකට ගොඩයමු කියලා යෝජනාවක තමයි යාළුවෝ හිටියේ



### හැමදෙනාම සමත් වී සිටීම ගැන සතුටුයි

### ඉංජිනේරු තාක්ෂණ විෂය ධාරාවේ ප්‍රථමයා නාරම්මල මයුරපාදයේ **කාව්‍ය රවිහංස කියයි**

**කුලියාපිටිය සමූහ - මෙවිරු ධනාන් අලව්ව සමූහ- ජයන්ත දිසානායක**





මෙවර පැවැති අධ්‍යාපන පොදුසහතික පත්‍ර උසස්පෙළ විභාගයේ ඉංජිනේරු තාක්ෂණ විෂයධාරාවේ ප්‍රථමයා වීමට නාරම්මල මයුරපාද විද්‍යාලයේ කාව්‍ය රවිහංස රොසයිරෝ සිසුවා සමත්විය.

කුරුණෑගල ශාන්ත ආනා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා තාක්ෂණික විෂයට ඇති ඇල්ම නිසාම ඒ සාමාර්ථ 9ක් සමඟ සාමාන්‍යපෙළ ජයගත් කාව්‍ය සිසුවා නාරම්මල මයුරපාද විද්‍යාලය උසස් පෙළ සඳහා තෝරාගෙන තිබිණ. අලව්ව ගොරොක්ගස්දෙණිය ප්‍රදේශයේ ජීවත් වූ ඔහු, මව පියා හා බාල සහෝදරියක සහිත පවුලක වැඩිමලා විය. කාව්‍ය, වගකීම් රැසක් තමා මත පටවාගෙන මේ ජයග්‍රහණය ලබා තිබීම විශේෂත්වයකි.

සාමාන්‍ය පෙළින් පසු ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටි අවධියේද නිවස ආසන්නයේ ගරාජයක පුහුණුවීම් මාස 6ක කාලයක් ලබා තිබීම ද මේ විෂය ධාරාව පහසුවන්නට ඇතැයි කාව්‍ය සිසුවාගේ විශ්වාසයයි. එහිදී තම ජයග්‍රහණය පිළිබඳව කාව්‍ය සිසුවා මෙසේද පැවසීය.

‘‘මමයි නංගියි ගෙදර ඉන්නේ. තාත්තා යුද හමුදාවේ විශ්‍රාමික නිලධාරියෙක්. මට පාඩම් වැඩවලට ගෙදර හැමෝම උදව් කළා. නංගියි මමයි නිවසේ ඉන්නේ දවල් කාලයේ තමයි අපි දෙන්න පාඩම් කළේ. මම කවදාවත් ඇහැරගෙනවත් පාන්දර නැගිටගෙනවත් පාඩම් කළේ නැහැ.දවල් කාලයේ තමයි සියල්ල කළේ. උසස් පෙළට ආවට පස්සේ මම හිතට අරගෙන වැඩ කළේ මොකක් හෝ ජයක් ලබන්න. පුදුම විදිහට පසුගිය ප්‍රශ්න පත්‍ර සාකච්ඡා කළා.මම මේ වනවිට අම්මා එක්ක කඩේක වැඩට යනවා. අපි මුදල් අයකැමියන් විදිහට වැඩ කරමින් හිටියේ. ප්‍රතිඵල ආවාම මගේ පවුලේ අය වගේම ඒ සියලුදෙනාත් ලොකු සතුටකට පත්වුණා. මම කියන්නේ දෙන තරමට තමයි ලැබෙන්නේ. අපි යාලුවො වැඩි පිරිසක් එක ගෙදරකට එකතුවෙලා එක එක්කෙනාට කියලා දෙනවා. ගොඩක් දෙනෙක්ට මම උදවු කළා වගේම මමත් අහගත්ත අවස්ථා තියනවා.අපි එකට ගොඩයමු කියලා යෝජනාවකයි අපි හිටියේ.ඒ හැම දෙනාම ඒ හා බී සාමාර්ථවලින් සමත් වෙලා තියනවා දැක්කාම හරි සතුටුයි. ඒකයි මම කියන්නේ අපි දෙන තරමටම ලැබෙනවා කියලා. මේ වෙලාවෙ මගේ අම්මා තාත්තා නංගි වගේම මගේ පාසල මතක් කරන්නම අවශ්‍යයි.ඉකුත් ආසන්නම වසරකත් තාක්ෂණවේදය ධාරාවේ ප්‍රථමයා අපේ පාසලින් බිහි කළා. අපේ විදුහල්පතිනිය නන්දිකා රණසිංහ මහත්මිය වගේම අපට දරුවන් වගේ සෙනෙහස බෙදමින් අකුරු කළ සම්පත් විජේසිංහ, තිළිණි හේරත්, කැලුම් ජයශාන්ත ගුරු මවුපියවරුන් වගේම උපකාරක පන්ති ගුරුතුමන්ලාත් මේ මොහොතේ ගෞරවයෙන් සිහිපත් කළ යුතුමයි“

## වෛද්‍ය ෂාෆි ෂිහාබ්දීන්ගේ දියණියටත් ජීව විද්‍යා අංශයෙන් A-3ක්

### ඇගේත් අපේක්ෂාව පියා මෙන් වෛද්‍යවරියක් වීම



**නෙරංජලා වික්‍රමසිංහ**

2019 වසරේදී ව්‍යාජ වන්ධ්‍යාකරණ චෝදනාවකට ලක් වූ වෛද්‍ය ෂාෆි ෂිහාබ්දීන්ගේ දියණිය, 2024 අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් ජීව විද්‍යා අංශයෙන් විශිෂ්ට ප්‍රතිඵල ලබාගෙන ඇත.

ඇය විද්‍යා විෂය ධාරාවෙන් A සාමාර්ථ 3 ක් ලබාගෙන ඇති අතර,දිස්ත්‍රික්කයේ 12 වැනි ස්ථානයත් දිවයිනේ 357 වැනි ස්ථානයත් ලබාගනිමින් රාජ්‍ය වෛද්‍ය පීඨයක ස්ථානයක් ලබාගෙන තිබේ.

වන්ධ්‍යාකරණ චෝදනාව පිළිබඳ මතභේදය අතරතුර ෂාෆි පවුල මුහුණදුන් දැඩි මහජන අප්‍රසාදය සහ මානසික පීඩනය හේතුවෙන් පාසලෙන් පවුලේ දරුවන්ට ඉවත්වීමට බල කෙරුණද, ඇය පෞද්ගලික අපේක්ෂිකාවක ලෙස විභාගයට පෙනී සිට ඇත.

මීට පෙර, ඇය අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් ද විශිෂ්ට ලෙස සමත් වී, A සාමාර්ථ 9 ක් ලබා ගත් අතර, තම පියා මෙන් වෛද්‍යවරියක් වීම තම අපේක්ෂාව බව සඳහන් කළාය.

පරීක්ෂණවලින් චෝදනා සනාථ කිරීමට කිසිදු සාක්ෂියක් නොලැබුණු පසුබිමක වෛද්‍ය ෂාෆි ෂිහාබ්දීන්ට එරෙහි නඩුව පසුව නිෂ්ප්‍රභ කරන ලදී.

## ගුරුවරුන්ගේ දිරිගැන්වීමත් මවුපියන්ගේ කැපවීමත් ජයග්‍රහණයට හේතුවක්



### ජීව විද්‍යා අංශයේ දිවයිනේ දෙවැනියා අනුරපුර මැදි විදුහලේ **කල්පා විදුසරණී**

**අනුරාධපුර අතිරේක අනුරාධපුර සංචාරක - බී.ජී.චතුරංග සහ තලාව සමූහ- ඩබ්ලිව්.ඩබ්ලිව්.ඩී.ධර්මකීර්ති**

අපොස උසස් පෙළ විභාග ඉතිහාසයේ ප්‍රථම වරට ජීව විද්‍යා අංශයේ දිවයිනේ දෙවැනි ස්ථානය අනුරාධපුර දිස්ත්‍රික්කයට හිමිකරදීමට අනුරාධපුර මධ්‍ය විද්‍යාලයේ කල්පා විදුසරණී ශිෂ්‍යාව සමත් වූවාය. මෙතෙක් අනුරාධපුර දිස්ත්‍රික්කයට ජීව විද්‍යා අංශයෙන් ජාතික මට්ටමේ ස්ථානයක් හිමිව තිබුණේ මෙයට වසර 10කට පෙරය. එය ජාතික මට්ටමේ හත්වැනි ස්ථානයයි. එම ස්ථානය ද අනුරාධපුර මධ්‍ය විද්‍යාලයේම සිසුවකු ලබාගෙන තිබිණි. ඇයගේ මව හෙදියක වන අතර පියා විශ්‍රාමික හමුදා නිලධාරියෙකි. කල්පා දියණිය අපොස සාමාන්‍ය පෙළ විභාගය අනුරාධපුර වලිසිංහ හරිස්චන්ද්‍ර විද්‍යාලයෙන් A නවයක් ලබා සමත් වී ඇති අතර ප්‍රාථමික අධ්‍යාපනය අනුරාධපුර ඩී.එස්. සේනානායක විද්‍යාලයෙන් ලැබූ බව ඇය සිහිපත් කරයි.

විදුහල්පති පර්සි ජයසුන්දර, නියෝජ්‍ය විදුහල්පති (පරිපාලන) අශෝක ගුණතිලක මහතා ඇතුළු ගෞරවනීය ආචාර්ය මණ්ඩලය සහ උදව් උපකාර කළ යහළු යෙහෙළියන්ද මෙහිදී සිහිපත් කරන ඇය තමාගේ සොහොයුරියගෙන් ලැබූ දැඩි කැපවීම සහ දිරිගැන්වීමද මවුපියන් ලබා දුන් අපරිමිත කැපවීම ද මේ ජයග්‍රහණයට හේතු වූ බව කල්පා දියණිය පැවසුවාය.